ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා ගෞරව උපාධි වැඩසටහන
පස්වන මට්ටම/හයවන මට්ටම - 2021/2022
අවසාන පරීක්ෂණය 2022
**STU5817/STU5827 - නාට්‍ය හා රංගකලාව ඉගැන්වීම සඳහා අධ්‍යාපන තාක්ෂණය**
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.11.27 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසින් 1 වන ප්‍රශ්නය ඇතුළුව තවත් ඕනෑම ප්‍රශ්න දෙකකට (02) සහ 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න දෙකකට (02) ද පිළිතුරු සපයන්න.

01. **<u>1 වන කොටස</u>**

(i) අධ්‍යාපන තාක්ෂණය යන සංකල්පය ඔබේ වචනයෙන් කෙටියෙන් විස්තර කරන්න.

(ii) අධ්‍යාපන තාක්ෂණය හා අධ්‍යාපනය සඳහා තාක්ෂණය යන්නෙහි වෙනස නිදසුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(iii) ඉගැන්වීමේ ශිල්පීය ක්‍රමවල ඇති වැදගත්කම නිදසුන් දෙකක් (02) ඇසුරින් පැහැදිලි කරන්න.

(iv) ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පාඩම් සැලසුමක ඇති වැදගත්කම කරුණු පහකින් (05) දක්වන්න.

(v) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අන්තර්ග්‍රහණය කිරීමේදී ගුරුවරයෙකු සලකා බැලිය යුතු සාධක දෙකක් (02) පැහැදිලි කරන්න.

(vi) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා බහුමාධ්‍ය භාවිතයෙහි ඇති වැදගත්කම සුදුසු නිදසුන් දෙකක් (02) ඇසුරින් පැහැදිලි කරන්න.

(vii) ඉගෙනීම සුසාධ්‍ය කරන්නෙකු ලෙස ගුරුවරයාගේ භූමිකාව කෙසේ වෙනස් විය යුතුදැයි සුදුසු උදාහරණ තුනක් (03) ඇසුරෙන් පැහැදිලි කරන්න.

Viii) මාර්ගගත (online) ඉගෙනුම් පරිසරයක් සංවිධානය කිරීමේ දී ගුරුවරයා මුහුණ දෙන අභියෝග තුනක් (03) දක්වා එම එක් අභියෝගයක් ජය ගැනීමට ගුරුවරයාට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් (02) යෝජනා කරන්න.

(ලකුණු 05 x 08 = 40)

02. (i) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2003) විසින් නාට්‍ය හා රංගකලාව විෂය සඳහා පෙන්වා දී ඇති ප්‍රධාන විෂය අරමුණු හතර (04) දක්වා ඉන් එක් විෂය අරමුණක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) සිසුන්ගේ නිර්මාණාත්මකව සිතීමේ හා සහසම්බන්ධතා ඇති කර ගැනීමේ හැකියාව වර්ධනය කිරීමට නාට්‍ය හා රංග කලාව යොදාගත හැකි ආකාරය උදාහරණ තුනක් (03) ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නාට්‍ය හා රංගකලාව විෂය සඳහා පෙන්වා දී ඇති විෂය අරමුණුවලට අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ගුරුවරයෙකු වශයෙන් ඔබගේ භූමිකාව කෙසේ විය යුතු ද යන්න සුදුසු උදාහරණ තුනක් (03) මගින් විස්තර කරන්න. (ලකුණු 06)

03. "උපදේශාත්මක සැලසුම් සහ ඉගෙනුම් ක්‍රියාවලීන් හා සම්බන්ධ න්‍යායන් කිහිපයක් ඇතුළත් කරමින් එඩ්ගා ඩේල් ගේ අත්දැකීම් කේතුව -Edgar Dale's Cone of Experience (1946) හඳුන්වා දෙන ලදී."

(i) එඩ්ගා ඩේල් ගේ අත්දැකීම් කේතුව පිළිබඳ දැනුම ගුරුවරයෙකුට වැදගත් වන ආකාරය කරුණු තුනක් (03) ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා නාට්‍යමය අත්දැකීම් යොදා ගැනීමෙන් සිසුන්ට අත්වන ප්‍රතිලාභ දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 04)

(iii) ඉහත දැක්වූ ප්‍රතිලාභ අත් කර ගැනීම සඳහා ඔබට අභිමත පාඩමක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී නාට්‍යමය අත්දැකීම් යොදා ගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

04. (i) ඉගෙනුම් ආධාරක යනු මොනවාදැයි ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ගුරුවරයාට හා ශිෂ්‍යයාට ඉගෙනුම් ආධාරකවල ඇති වැදගත්කම කරුණු දෙකක් (02) බැගින් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) "නිර්මාණශීලී ඉගෙනුම් ආධාරක භාවිතය මගින් පන්තිකාමරය තුළ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කළ හැකි ය." හේතු තුනක් (03) දක්වමින් ඉහත ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 05)

05. (i) ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් වෙනස් වන්නේ කෙසේදැයි කරුණු තුනක් (03) දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ii) ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශය තුළදී ගුරුවරයා මුහුණ දෙන අභියෝග දෙකක් (02) විස්තර කරන්න. (ලකුණු 04)

(iii) ඔබ ඉහත දැක්වූ අභියෝග ජය ගැනීමට ගුරුවරයාට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග එක බැගින් යෝජනා කරන්න. (ලකුණු 04)

## 2 වන කොටස

06. (i) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ නාට්‍යානුසාර ක්‍රමයෙන් උගන්වන විට ගුරුවරයා ඒ සඳහා සුදුසු ක්‍රම තෝරා ගත යුතුයි. නාට්‍යානුසාර ක්‍රම තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු නිර්ණායක හතරක් (04) දක්වන්න. (ලකුණු 04)

(ii) නාට්‍ය හා රංගලකලාව විෂය ඉගැන්වීමේ දී යොදාගත හැකි නාට්‍යානුසාර ක්‍රම හතරක් (04) නම් කර ඉන් එක් ක්‍රමයක් පන්තිකාමරය තුල යොදාගත හැකි ආකාරය පියවර වශයෙන් දක්වන්න. (ලකුණු 06)

(iii) ඉහත ඔබ පැහැදිලි කළ නාට්‍යානුසාර ක්‍රමය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී යොදා ගන්නා විට ගුරුවරයෙකුට මුහුණදීමට සිදුවන අභියෝග දෙකක් (02) දක්වා ඒවායෙහි ජය ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. (i) සුවිශේෂී චර්යාමය අරමුණක් ලිවීමේ දී සැලකිය යුතු කොන්දේසි/තත්ත්ව පහ (05) සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) ඔබ ඉහත සඳහන් කළ කොන්දේසි/තත්ත්ව අනුගමනය කරමින් කණිෂ්ඨ ද්විතියික ශ්‍රේණියක නාට්‍ය හා රංගකලා පාඩමකට අදාලව සුවිශේෂී චර්යාමය අරමුණු තුනක් (03) ගොඩනගන්න. (ශ්‍රේණිය සහ පාඩම දක්වන්න.) (ලකුණු 03)

(iii) එම පාඩමේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ඔබ ඉහත සඳහන් කළ සුවිශේෂී චර්යාමය අරමුණු ඉටු කරගන්නා ආකාරය පියවරෙන් පියවර පැහැදිලි කරන්න. (ලකුණු 07)

08. (i) සුනත්‍ය ඉගෙනුම් අත්දැකීමක් (Authentic-Learning Experience) යනු කුමක්දැයි නිදසුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) පාසල් පන්තිකාමරය සඳහා සුනත්‍ය ඉගෙනුම් අත්දැකීම (Authentic-Learning Experience) කොතෙක්දුරට වැදගත් වන්නේ ද යන්න උදාහරණ දෙකක් (02) මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) ඔබ නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකු වශයෙන් කණිෂ්ඨ-ද්විතීයික පන්තිකාමරයේ පාඩමක් සඳහා සුනත්‍ය ඉගෙනුම් අත්දැකීම (Authentic-Learning Experience) සහිත පාඩමක් සංවර්ධනය කරන ආකාරය පියවර සහිතව විස්තර කරන්න. (ලකුණු 08)

09. (i) නාට්‍ය හා රංගකලාව ඉගැන්වීමේ දී යොදාගත හැකි සුවිශේෂී ක්‍රමයක් වන "විචාර ආසන ක්‍රමය" යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) ඕනෑම ශ්‍රේණියක නාට්‍ය හා රංගකලා විෂයයට අදාල පාඩමක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා "විචාර ආසන ක්‍රමය"යොදා ගන්නා ආකාරය පියවරෙන් පියවර පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) ඉහත දැක්වූ පාඩමේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට "විචාර ආසන ක්‍රමය" යොදා ගැනීමෙන් ශිෂ්‍යයාට ලැබෙන ප්‍රතිලාභ පහක් (05) දක්වන්න. (ලකුණු 05)

හිමිකම් ඇවිරිණි.